# 3.

## රතන සූත්‍රය

1. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛේ
සබ්බේව භූතා සුමනා භවන්තු
අථෝපි සක්කච්ච සුණන්තු භාසිතං

2. තස්මා හි භූතා නිසාමේථ සබ්බේ
මෙත්තං කරෝථ මානුසියා පජාය
දිවා ච රත්තෝ ච හරන්ති යේ බලිං
තස්මා හි නේ රක්ඛථ අප්පමත්තා

3. යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගේසු වා යං රතනං පණීතං
න නෝ සමං අත්ථි තථාගතේන
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

4. ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතෝ
න තේන ධම්මේන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු



## රතන සූත්‍රය (සිංහල තේරුම)

1. මෙහි රැස්වූ සියලු අමනුෂ්‍යයෝ ම සතුටු සිත් ඇත්තෝ වෙත්වා, තවද මගේ වචනය සකසා අසත්වා.

2. භූතයිනි, එබැවින් තෙපි මාගේ වචනය අසව්. මනු වගට නිතර මෙත් කරවු. යම් කෙනෙක් රෑ දවල් ඔබට පුද පඬුරු දෙත් නම්, ඔවුන් නොපමාව රකිවු.

3. මෙලොව හෝ අන් ලොවක යම් ධනයක් වේද, දෙව්ලොව හෝ මහඟු රුවනක් වේද (ඒ අතුරින්) බුදුරදුන් හා සමාන වූවක් නැත. මේ හෙයින් බුදු රදුන් උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් ම වේවා.

4. එකඟ සිත් ඇති මේ ශාක්‍ය මුනීන්ද්‍රයාණෝ සියලු කෙලෙස් නසාලන, රාගයෙන් වෙන්ව ඇති මරණය ද නොමැති වූ නිවන පසක් කළේ ද ඒ දහම හා සම වූ කිසිත් නැත්තේ ය. ඒ දහම (නිවන) උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් ම වේවා.

5. යං බුද්ධසෙට්ඨෝ පරිවණ්ණයී සුචිං
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනා තේන සමෝ න විජ්ජති
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

6. යේ පුග්ගලා අට්ඨ සතං පසත්ථා
චත්තාරි ඒතානි යුගානි හොන්ති
තේ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
ඒතේසු දින්නානි මහප්ඵලානි
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

7. යේ සුප්පයුත්තා මනසා දළ්හේන
නික්කාමිනෝ ගෝතමසාසනම්හි
තේ පත්තිපත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු



5. උතුම් බුදුරජාණෝ සුපිරිසිදු යම් මාර්ග සමාධියක් වර්ණනා කළේ ද, (එය වඩනු සමග) ඵල දෙන සමාධියක් යයි කියත්, ඒ සමාධියට සම වෙතත් සමාධියක් නැත. මේ හෙයින් ඒ දහම උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් ම වේවා.

6. සත්පුරුෂයන් විසින් පසසන ලද ආර්ය පුද්ගලයන් අට දෙනෙක් හෝ යම් එකසිය අටක් උතුම් පුද්ගල කෙනෙක් වෙත් ද, ඒ සැම දෙන යුගල සතරක් වෙති. මෙකී සුගත් සව්වෝ දන් පිදීමට (දක්ෂිණාවට) සුදුසු වෙති. ඔවුන් හට පිදූ දෙයින් බොහෝ අනුසස් ලැබේ. මේ හෙයින් ඒ සඟ ගණ උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් ම වේවා.

7. යම් කෙනෙක් තිර සිතින් බුදු සසුනෙහි යෙදී, කෙලෙසුන් ගෙන් නික්මගත්තේ වෙත්ද, ඔවුහු නිවනට බැස, නිතැතින් ම නිවන් ඵල සුව විඳින්නාහු, සැපැත්විය යුතු රහත් ඵලයට ද පත්වූවාහු වෙති. මේ හෙයින් ඒ සඟ ගණ උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් ම වේවා.

8. යථින්දඛීලෝ පඨවිංසිතෝසියා
චතුබ්භි වාතේභි අසම්පකම්පියෝ
තථූපමං සප්පුරිසං වදාමි
යෝ අරියසච්චානි අවෙච්ච පස්සති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

9. යේ අරිය සච්චානි විභාවයන්ති
ගම්භීර පඤ්ඤේන සුදේසිතානි
කිඤ්චාපි තේ හොන්ති භුසප්පමත්තා
න තේ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

10. සහාවස්ස දස්සනසම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කායදිට්ඨී විචිකිච්ඡිතඤ්ච
සීලබ්බතං වාපි යදත්ථි කිඤ්චි
චතූහපායේහි ච විප්පමුත්තෝ
ඡචාභිඨානානි අභබ්බෝ කාතුං
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු



8. යම් සේ පොළොව කා වැදීගත් ඉන්ද්‍රඛීලයක්, සිව් දිගින් එන සුළඟින් නො සැලේ ද, ආර්ය සත්‍ය නුවණින් දත් (සෝවාන්) ඒ සත්පුරුෂ පුද්ගලයා ද එලෙසම (නොසැලෙන) බව කියමි. මේ හෙයින් ඒ සඟ ගණ උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් ම වේවා.

9. ගම්භීර ප්‍රඥා ඇති බුදුරදුන් මනා ලෙස දෙසූ, චතුරාර්ය සත්‍ය යම් කෙනෙක් (සෝවාන් වූ) තමා ම අවබෝධ කෙරෙත් ද, ඔහු බොහෝ ප්‍රමාද වූ නමුදු, නැවත කිසි විටෙක අටවන භවයකට නොයෙති. මේ හෙයින් ඒ සඟ ගණ උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් ම වේවා.

10. මේ සෝවාන් පුද්ගලයා සෝවාන් මග නුවණ පහළ වීම සමග ම සක්කාය දිට්ඨී, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස යන තුන් සංයෝජන දුරුකරන ලද්දේ වෙයි. හෙතෙම සතර අපායෙන් මිදුනේ වෙත්, පංච ආනන්තරීය කර්ම හා මිසදිටු ගැනීම යන මහ පව් හය කරන්නට හෝ නොනිසි වෙත් මේ හෙයින් ඒ සඟ ගණ උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත්ම වේවා.

11. කිඤ්චාපි සෝ කම්මං කරෝති පාපකං
කායේන වාචා උද චේතසා වා
අභබ්බෝ සෝ තස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා
ඉදම්පි සංඝේ රතනං පණීතං
එතේන සච්චේන සුවත්ථි හෝතු

12. වනප්පගුම්බේ යථා ඵුස්සිතග්ගේ
ගිම්හානමාසේ පඨමස්මිං ගිම්හේ
තථූපමං ධම්මවරං අදේසයී
නිබ්බාණගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
එතේන සච්චේන සුවත්ථි හෝතු

13. වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ
අනුත්තරෝ ධම්මවරං අදේසයී
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
එතේන සච්චේන සුවත්ථි හෝතු

14. ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්තචිත්තා ආයතිකේ භවස්මිං
තේ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථායම්පදීපෝ
ඉදම්පි සංඝේ රතනං පණීතං
එතේන සච්චේන සුවත්ථි හෝතු



11. හෙතෙම තිදොරින් පව්කමක් කරන්නේ ද, එය කිසි විටෙක ඔහු නොසඟවන්නේ ය. නිවන් පද දුටු ඔහුගේ (සෝවාන් පුද්ගලයා) වරද නොසැඟවෙන බව (අභව්‍ය) (බුදුමුවින්) දෙසන ලදී. මේ හෙයින් ඒ සඟ ගණ උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් ම වේවා.

12. ගිම්හාන ඍතුවේ මුල් මස හෙවත් බක් මසේ, වන වදුල කුසුම් පිපි අගින් යුතු වන්නේ යම් සේද, එබඳු වූ නිවනට පමුණුවන දහම පරහිත පිණිස බුදුරදහු දෙසූහ. මේ හෙයින් බුදුරදුන් උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් ම වේවා.

13. උතුම් නිවන දන්නා වූ, උතුම් නිවන සතහට දෙන්නා වූ, නිවන් මග ගෙනහැර පාන්නා වූ, අනුත්තර වූ බුදුරදුන් උතුම් දහමක් දෙසූ සේක. මේ හෙයින් බුදුරදුන් උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් ම වේවා.

14. යමෙකු පෙර කළ කර්ම ක්ෂය කළේ ද, නව කර්ම නොකෙරේ ද මතු භවයක් කෙරෙහි නොඇලුණු සිත් ඇති, මතු පිළිසිඳගැනුමකට හේතු නැති, ඡන්දය නැති දිරිමත් රහත්හු මේ පහන නිවුන සේ පිරිනිවෙති. මේ හෙයින් සඟ ගණ උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් ම වේවා.

15. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛේ
තථාගතං දේවමනුස්ස පූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හෝතු

16. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛේ
තථාගතං දේවමනුස්ස පූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හෝතු

17. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛේ
තථාගතං දේවමනුස්ස පූජිතං
සංඝං නමස්සාම සුවත්ථි හෝතු



15. මෙතැන්හි රැස්වූ, පොළොවෙහි වූ හෝ අහසෙහි වූ හෝ අමනුෂ්‍යයෝ වෙත් ද, ඔවුහු මම (ශක්‍රයා) සමග දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත බුදුරදුන් නමදිමු. එයින් සතට සෙත් වේවා.

16. මෙතැන්හි රැස්වූ පොළොවෙහි වූ හෝ අහසෙහි වූ හෝ අමනුෂ්‍යයෝ වෙත් ද, ඔවුහු මම (ශක්‍රයා) සමග දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත ධර්මය නමදිමු. එයින් සතට සෙත් වේවා.

17. මෙතැන්හි රැස්වූ පොළොවෙහි වූ හෝ අහසෙහි වූ හෝ අමනුෂ්‍යයෝ වෙත් ද, ඔවුහු මම (ශක්‍රයා) සමග දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත සඟ ගණ නමදිමු. එයින් සතට සෙත් වේවා.